# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1422/2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2023 திகதி

දිනය / Date – 14/11/2023 පැය 1050

**මාධ්‍ය නිවේදනය**

**ත්‍රිරෝද රථ සොරාගත් සැකකරුවන් තිදෙනෙකු හෙරොයින් සමඟ අත්අඩංගුවට - හෝමාගම පොලිස් ස්ථානය.**



2023.11.12 වන දින සවස් කාලයේ හෝමාගම පොලිස් වසමේ පිටිපන දකුණ ප්‍රදේශයේ දී හෝමාගම පොලිස් ස්ථානයේ නිලධාරින්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර දිවයිනේ විවිධ ප්‍රදේශවල ත්‍රිරෝද රථ සොරාගත් සැකකරුවන් තිදෙනෙකු හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 200 ක්, හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 300 ක් සහ හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 250 ක් බැගින් සන්තකයේ තබාගෙන සිටිය දී අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 28, 33 සහ 39 වයස්වල පසුවන පිටිපන දකුණ, හෝමාගම ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මෙම සැකකරුවන්ගෙන් සිදුකල ප්‍රශ්න කිරීමේ දී මහරගම පොලිස් වසමේ දි සොරාගත් ත්‍රිරෝද රථ දෙකක්, හොරණ පොලිස් වසමේ දී සොරාගත් ත්‍රිරෝද රථයක් සහ බණ්ඩාරගම පොලිස් වසමේ දී සොරාගත් ත්‍රිරෝද රථයක් සොයාගෙන ඇති අතර ඉන් එක් ත්‍රිරෝද

රථයක් කොටස් කර තිබිය දී හෝමාගම පොලිසිය විසින් සොයාගෙන ඇත. මේ සම්බන්ධයෙන් හෝමාගම පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

සැකකරුවන් විසින් සොරාගත් ත්‍රිරෝද රථ වල ඡායාරූපයක් මේ සමඟ ඔබ වෙත යොමු කරමි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**